# පුරප්පාඩු

## රාජ්‍ය ඖෂධ නිෂ්පාදන සංස්ථාව (SPMC)

### ඖෂධ නිෂ්පාදනය, සැපයීම හා නියාමන රාජ්‍ය අමාත්‍යාංශය

පහත සඳහන් පුරප්පාඩු පිරවීම සඳහා සුදුසුකම්ලත්, කාර්යශූර, ස්වයංගාමක, වෘත්තීය උන්නතිගාමී කණ්ඩායම් හැඟීමෙන් කටයුතු කළ හැකි අයවලුන් රාජ්‍ය ඖෂධ නිෂ්පාදන සංස්ථාව සමග අත්වැල් බැඳගැනීම අපි අපේක්ෂා කරමු.

**සෑම අයදුම්කරුවෙකුම :**

i. ශ්‍රී ලාංකීය පුරවැසියෙකු විය යුතුය.

ii. තනතුරේ වගකීම් නිසිලෙස ඉටු කිරීමට සහ දිවයිනේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමට හැකි මනා ශාරීරික සහ මානසික යෝග්‍යතාවයකින් යුක්ත විය යුතුය.

iii. මනා චරිතයකින් යුක්ත අයෙකු විය යුතුය.

### 01. නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී තත්ත්ව පාලන (HM 1-1)

**ඵලදායි වෘත්තීය ප්‍රගමනය**

තත්ත්ව පාලන අංශ ප්‍රධානී වන අතර, තත්ත්ව පාලනය පිළිබඳ සියලුම කටයුතු සම්බන්ධයෙන් සභාපති / කළමනාකාර අධ්‍යක්ෂක සහ සාමාන්‍යාධිකාරී වෙත වගකිව යුතුය. මෙම සංස්ථාවේ තත්ත්ව පාලන අංශයට නායකත්වය දිය හැකි උසස් හැකියාවක් සහිත ප්‍රතිඵල වලට නැඹුරු අයෙකු විය යුතුය.

**සුදුසුකම් : බාහිර අපේක්ෂකයින්**

(අ) (i) විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගනු ලබන විශ්වවිද්‍යාලයකින් ලබාගත් පළමු හෝ දෙවන පන්තිය සහිතව රසායන විද්‍යාව ඇතුළුව විද්‍යාවේදී සාමාන්‍ය උපාධියක් හෝ ක්ෂේත්‍රයට අදාළ සමාන සුදුසුකම් **හෝ**

(ii) විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගනු ලබන විශ්වවිද්‍යාලයකින් ලබාගත් රසායන විද්‍යාවේ විද්‍යාවේදී විශේෂ උපාධියක් හෝ ක්ෂේත්‍රයට අදාළ සමාන සුදුසුකම් **හෝ**

(iii) විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගනු ලබන විශ්වවිද්‍යාලයකින් රසායන විද්‍යාව ඇතුලුව ලබා ගත්, විද්‍යාවේදී සාමාන්‍ය උපාධියක් හෝ ක්ෂේත්‍රයට අදාළ සමාන සුදුසුකම් ලබා තිබීම **සහ**

(ආ) (i) විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගනු ලබන විශ්වවිද්‍යාලයකින් ලබාගත් විශ්ලේෂණ රසායන විද්‍යා ක්ෂේත්‍රට අදාළ හෝ ඖෂධ පිළිබඳ ඕනෑම විද්‍යාත්මක පරීක්ෂණ / විශ්ලේෂණ පශ්චාත් උපාධියක් (Masters) ලබා තිබීම **හෝ**

(ii) රසායන විද්‍යායතනයේ ආයතනික සාමාජිකත්වය **සහ**

(ඇ) රජයේ / රාජ්‍ය සංස්ථාවක / මණ්ඩලයක / ව්‍යවස්ථාපිත මණ්ඩලයක හෝ පිළිගත් වාණිජ ආයතනයක, ඖෂධ / ආහාර ක්ෂේත්‍රයේ විද්‍යාත්මක ඇගයීම් / රසායනාගාර පරීක්ෂණ / නිෂ්පාදන හා පර්යේෂණ ක්ෂේත්‍රයට අදාළ කළමනාකරණ මට්ටමේ (MM 1-1) අවම වශයෙන් වසර 12 ක පශ්චාත් සුදුසුකම් පළපුරුද්ද ලබා තිබීම.

### 02. නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී - වට්ටෝරු, පර්යේෂණ හා සංවර්ධන (HM 1-1)

**ඵලදායි වෘත්තීය ප්‍රගමනය**

වට්ටෝරු, පර්යේෂණ හා සංවර්ධන අංශ ප්‍රධානියා වන අතර, වට්ටෝරු, පර්යේෂණ හා සංවර්ධනය පිළිබඳ සියලුම කටයුතු සම්බන්ධයෙන් සභාපති / කළමනාකාර අධ්‍යක්ෂක සහ සාමාන්‍යාධිකාරී වෙත වගකිව යුතුය. මෙම සංස්ථාවේ වට්ටෝරු, පර්යේෂණ හා සංවර්ධන අංශවලට නායකත්වය දිය හැකි උසස් හැකියාවක් සහිත ප්‍රතිඵලවලට නැඹුරු අයෙකු විය යුතුය.

**සුදුසුකම් : බාහිර අපේක්ෂකයින්**

(අ) (i) විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගනු ලබන විශ්වවිද්‍යාලයකින් ලබාගත්, පළමු හෝ දෙවන පන්තිය සහිත රසායන විද්‍යාව ඇතුළුව විද්‍යාවේදී සාමාන්‍ය උපාධියක් හෝ ක්ෂේත්‍රයට අදාළ සමාන සුදුසුකම් **හෝ**

(ii) විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගනු ලබන විශ්වවිද්‍යාලයකින් ලබාගත්, රසායන විද්‍යාවේ විද්‍යාවේදී විශේෂ උපාධියක් හෝ ක්ෂේත්‍රයට අදාළ සමාන සුදුසුකම් **හෝ**

(iii) විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගනු ලබන විශ්වවිද්‍යාලයකින් රසායන විද්‍යාව ඇතුළුව ලබාගත් විද්‍යාවේදී සාමාන්‍ය උපාධියක් හෝ ක්ෂේත්‍රයට අදාළ සමාන සුදුසුකම් ලබා තිබීම. **සහ**

(ආ) (i) විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගනු ලබන විශ්වවිද්‍යාලයකින් ලබාගත් විශ්ලේෂණ රසායන විද්‍යා ක්ෂේත්‍රයට අදාළ හෝ ඖෂධ පිළිබඳ ඕනෑම විද්‍යාත්මක පරීක්ෂණ / විශ්ලේෂණ පශ්චාත් උපාධියක් (Masters) ලබා තිබීම **හෝ**

(ii) රසායන විද්‍යා ආයතනයේ ආයතනික සාමාජිකත්වය **සහ**

(ඇ) රජයේ / රාජ්‍ය සංස්ථාවක / මණ්ඩලයක / ව්‍යවස්ථාපිත මණ්ඩලයක හෝ පිළිගත් වාණිජ ආයතනයක, ඖෂධ / ආහාර ක්ෂේත්‍රයේ විද්‍යාත්මක ඇගයීම් / රසායනාගාර පරීක්ෂණ / නිෂ්පාදන හා පර්යේෂණ ක්ෂේත්‍රයට අදාළ කළමනාකරණ මට්ටමේ (MM 1-1) අවම වශයෙන් වසර 12 ක පශ්චාත් සුදුසුකම් පළපුරුද්ද ලබා තිබීම.

**තනතුරු (1) සහ (2) සඳහා සුදුසුකම් : අභ්‍යන්තර අපේක්ෂකයින්**

තනතුරට අදාළ විෂය ක්ෂේත්‍රයක කළමනාකාර සේවා ගණයේ (MM 1-1) 1 වන ශ්‍රේණියේ තනතුරක අවම වශයෙන් වසර දෙකක (2) සතුටුදායක අඛණ්ඩ සේවය

**තනතුරු (1) සහ (2) සඳහා පොදු කරුණු**

- **වැටුප් පරිමාණය :** HM 1-1 - 2016 : රු. 80,295/- - 15x2,270/- - 114,345/-
- **වයස :** අවුරුදු 35 ට අඩු නොවිය යුතු අතර, අවුරුදු 55 ට වැඩි නොවිය යුතුය. අභ්‍යන්තර අපේක්ෂකයින් සඳහා උපරිම වයස් සීමාව අදාළ නොවේ.
- **බඳවා ගැනීමේ ක්‍රමය :** ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක් මගින්.

**තනතුරු (1) සහ (2) සඳහා අනෙකුත් ප්‍රතිලාභ :**

- සංස්ථාව විසින් නඩත්තු කරනු ලබන නිල වාහනයක් හෝ අංක PED 1/2015(i) චක්‍රලේඛය ප්‍රකාරව තමන්ගේ වාහනය සඳහා දීමනාවක්
- ඉන්ධන දීමනාව (මාසිකව ඩීසල් හෝ පෙට්‍රල් ලීටර් 120 ක්)

**ආන්තික ප්‍රතිලාභ :**

- පැමිණීමේ හා කාර්ය සාධන දිරිදීමනා
- උපයෝගීකර නොගත් වාර්ෂික හා වෛද්‍ය නිවාඩු ප්‍රතිපූර්ණය
- වෛද්‍ය රක්ෂණ යෝජනාක්‍රමයක් හා වෛද්‍ය වියදම් ප්‍රතිපූර්ණය
- සංස්ථාව විසින් වැටුපෙන් 15% ක්ද, සේවකයා 10% ක්ද වශයෙන් සේවක අර්ථසාධක අරමුදලට දායක වීම.
- සංස්ථාව විසින් සේවා නියුක්තිකයන්ගේ භාර අරමුදලට වැටුපෙන් 3% ක් වශයෙන් දායක වනු ඇත.

**පොදු උපදෙස් :**

- නියමිත ආකෘති පත්‍රවල සකසන ලද අයදුම්පත්, ඥාතීන් නොවන නිර්දේශකයන් දෙදෙනෙකුගේ නම්, ලිපිනයන් හා විමසුම් විස්තර සමග ඉදිරිපත් කළ යුතුය. සියලුම අධ්‍යාපන සහතිකවල සහතික කළ පිටපත්, අයදුම්පත සමග අමුණා තිබිය යුතුය. අදාළ අයදුම්පත ශ්‍රී ලංකා රාජ්‍ය ඖෂධ නිෂ්පාදන සංස්ථාවේ නිල වෙබ් අඩවිය වන http://www.spmclanka.lk වෙතින් බාගත (Download) කරගත හැකිය.
- රජයේ දෙපාර්තමේන්තු හා ව්‍යවස්ථාපිත මණ්ඩලවල සේවයේ නියුතු අයදුම්කරුවන්, තම අයදුම්පත්, අදාළ ආයතන ප්‍රධානී මාර්ගයෙන් යොමු කළ යුතු අතර, ආයතන ප්‍රධානී විසින් අයදුම්කරු මෙම තනතුරට තෝරාගනු ලැබුවහොත්, දැනට දරන තනතුරින් නිදහස් කළ හැකිද යන්න සහතික කළ යුතුය.
- අයදුම්පත බහාලු කවරයේ වම් ඉහළ කෙළවරේ අයදුම් කරනු ලබන තනතුර සඳහන් කළ යුතු අතර, අයදුම්පත් මෙම දැන්වීම පළවී දින 10 ක් ඇතුළත, පහත සඳහන් ලිපිනයට, ලියාපදිංචි තැපෑලෙන් ලැබීමට සැලැස්විය යුතුය.
- ඉහත අවශ්‍යතා සපුරාලනු නොලබන අයදුම්පත් ප්‍රතික්ෂේප කෙරේ.

**සභාපති,**
**රාජ්‍ය ඖෂධ නිෂ්පාදින සංස්ථාව,**
**අංක 11, ශ්‍රීමත් ජෝන් කොතලාවල මාවත,**
**කඳවලවත්ත, රත්මලාන.**